**ඉඩම් මැනුම් සභාව - 2023**

---------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ඉඩම් මැනුම් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 2002 අංක 17 දරන මැනුම් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2016 අංක 12 දරන තොරතුරු පනතේ 25(1) වගන්තිය | තොරතුරු නිලධාරියෙකු විසින් හැකි ඉක්මනින් සහ ඉල්ලීමක් ලැබී දින දාහතරක් ඇතුළත අදාළ තීරණය, ඉල්ලීම් කළ පුරවැසියාට වහාම සන්නිවේදනය කළ යුතු බව සඳහන් වුවද 2023 වර්ෂයේ ලද තොරතුරු ඉල්ලීම් 23 කින් 09 කට පිළිතුරු ලබා දී නොමැති අතර පිළිතුරු ලබාදුන් ඉල්ලීම් 14 න් 12 ක් සඳහා දින දාහතර ඉක්මවා දින 01 සිට දින 165 ක පරාසයක කාල පමාවක් සිදු වී තිබුණි. | තොරතුරු ඉල්ලීම් 09 කට පිළිතුරු ලබා දී තොරතුරු ඉල්ලීම් ලද බව දන්වා යවා ඇත.තොරතුරු ලබා දීමේදී මැනුම් සභාවේ මතය විමසීමක් සිදු කළ යුතු ආකාරයේ තොරතුරු ඉල්ලීම් වූ බැවින් මැනුම් සභාවේ මතය විමසීමට ඉදිරිපත් කොට ඇත. එය ලද වහාම තොරතුරු ලබා දීමට හැකියාවක් පවතී නම් තොරතුරු ලබා දීමටද, ප්‍රතික්ෂේප කිරීමට සිදු වුවහොත් ඒ බවද දන්වා යැවීමට කටයුතු කරමි.<br>තොරතුරු ලබා දුන් ඉල්ලීම් 14 අතුරින් 2 ක් සඳහා එක එල්ලේ තොරතුරු ලබා දීමට හැකියාව තිබූ බැවින් ඒ සඳහා පිළිතුරු ලබා දෙන ලදි. ඉතිරි 12 සභාවේ මතය විමසා අවසර ලද පසු පිළිතුරු ලබා දීමට කටයුතු කරන ලදි. ඉදිරියේදී දින 14 තුලදී පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ඉල්ලීමක් ලැබී දින දාහතරක් ඇතුළත අදාළ තීරණය, ඉල්ලීම් කළ පුරවැසියාට වහාම සන්නිවේදනය කළ යුතුය. |
| 2002 ඔක්තෝම්බර් 04 දිනැති 2002 අංක 17 දරන මැනුම් පනත | | | |
| (i) 32(1) වගන්තිය | සභාව විසින් පත්කරනු ලබන ලේකම්වරයෙකු සිටිය යුතු වුවත් 2002 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලේකම්වරයෙකු පත් කර නොතිබුණි. | ලේකම්වරයෙකු පත් කර ගැනීම සඳහා පුවත්පත්වල හා ගැසට් නිවේදන සඳහා ලැබුණු අයදුම්පත්‍ර 19 අතුරින් දෙදෙනෙකු පමණක් සම්මුඛ පරීක්ෂණයට සහභාගි විය. ඔවුන් මූලික සුදුසුකම් සපුරා නොතිබීම මත බඳවා ගැනීමක් සිදු නොකරන ලදි. | ලේකම්වරයෙකු නොපමාව පත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට බඳවා ගැනීමේ සුදුසුකම්වල පවතින, “රාජ්‍ය අංශයේ වසරක ප්‍රායෝගික පලපුරුද්ද හෝ පුද්ගලික අංශයේ ද වසරක පළපුරුද්ද ද” ලෙසට අදාළ සුදුසුකම් සංශෝධනය කොට ඇතුළත් කර බඳවා ගැනීමේ පරිපාටිය නැවත සංශෝධනයට කටයුතු සූදානම් කර ඇත. | |
| (ii) 38(උ) වගන්තිය | සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සකස් කර නොතිබුණි. | සභාවේ ලියාපදිංචිය සහ වාර්ෂික මැනුම් බලපත්‍රය ලබා දීම යන කරුණු සම්බන්ධයෙන් වන රීති මේ වන විට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කොට එහි පළමු සංශෝධන සහ නිරීක්ෂණ ලැබී ඇත. එකී නිරීක්ෂණ හා සංශෝධන නැවත සකස් කොට අවසන් අතර අවසාන වරට එය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කර ඇත. ඒ අනුව අදාළ අනුමැතිය ලද විගස සභාවේ ප්‍රධාන කර්තව්‍යයක් වන ලියාපදිංචිය සහ වාර්ෂික මැනුම් බලපත්‍රය සම්බන්ධයෙන් රීති ගැසට් පත්‍රයේ පල කිරීමට කටයුතු කරනු ඇත. | පරිපාලනය සම්බන්ධයෙන් රීති සකස් කළ යුතුය. |
| (iii) 46 (2) (1) වගන්තිය | සභාව වෙත ඉදිරිපත් කෙරෙන මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳ පැමිණිලි විභාග කිරීම කළ යුතු වුවද 2023 වර්ෂයට පෙර ලැබී තිබුණු පැමිණිලි 134 හා 2023 වර්ෂයේදී ලැබී තිබුණු පැමිණිලි 78 ද ඇතුළුව 212 ක් වූ පැමිණිලි අතුරින් පැමිණිලි 149 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විසඳා නොතිබුණි. | පැමිණිලි විභාග කිරීමේදී පැමිණිල්ල සම්බන්ධයෙන් වග උත්තරකාර පාර්ශවයන්ට ප්‍රකාශ ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කල් ලබාදීමත්, (දින 28 ක කාලයක්) උප කමිටු මගින් පැමිණිල්ල සහ ඒ සම්බන්ධ ලිඛිත සාක්ෂි හොඳින් විමර්ෂණය කොට පාර්ශව කැඳවීම් කිරීමත් මසකට වරක් හෝ අවස්ථානුකූලව දෙවරක් පැමිණිලි විභාග කරන අතර පැමිණිලි පාර්ශවය හෝ වග උත්තරකාර පාර්ශවය සාධාරණ හේතු දක්වා නොපැමිණෙන අවස්ථාව වල සභාව තීරණය කර තව දුරටත් අවස්ථා ලබාදීම සිදුකිරීමත් යන ප්‍රධාන කරුණු හා තවත් වක්‍ර කරුණු හේතුවෙන් පැමිණිලි විසඳීම පිළිබඳ කාර්ය සාධන දර්ශකයක් නිශ්චිත කල නොහැක. තවද | සභාවට ලැබෙන පැමිණිලි නොපමාව විසඳිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කොරෝනා වසංගත කාලයේ පැවති පැමිණිලි විභාග කිරීමට නොහැකි වූ බැවින් තවමත් එම පැමිණිලි ගොනුද විභාග කිරීමට පවතී.<br><br>ඉහත කරුණු වලට අමතරව සභාවේ මූල්‍ය තත්වය අනුව පැමිණිළි විභාග කිරීමට වැඩි වාර ගණනක් සිදුකිරීමට සභාව සලකා බලමින් ඇත. | |
| (iv) | මැනුම් පනතෙහි 47(1) (ඈ) වගන්තිය | වාර්ෂික මැනුම් බලපත්‍රය අත්හිටුවා ඇති බවට 2023 සැප්තැම්බර් 27 දින අංක 2352 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති නාම ලේඛණයේ සඳහන් නම් 13 අතරින් එක් මිනින්දෝරුවරයෙක් පිළිබඳව පමණක් වාර්ෂික වාර්තාවේ ඇතුළත්ව තිබුණි. | 2023 සැප්තැම්බර් 27 දින අංක 2352 දරණ ගැසට් පත්‍රයේ පල කර ඇති නාම ලේඛණයේ සඳහන් නම් 13 වාර්ෂික පුහුණු බලපත්‍ර අත්හිටුවා ඇති මිනින්දෝරුවරුන්ගේ නාම ලේඛණය වන අතර විගණනයට ඉදිරිපත් කරන ලද වාර්ථාවේ ඇතුළත් කර ඇති නම් වල සඳහන් වනුයේ බලයලත් මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය හා වෙනත් විෂමාචාර සම්බන්ධ දඬ නියම කරන ලද නාම ලේඛණයකි.<br><br>එහිදී ටී. බී. එස් සංගරන්දෙණිය මහතා විසින් එම නාම ලේඛණ දෙකටම යටත්ව දඬුවම් ලබා ඇති බැවින් ගැසට් පත්‍රයේ පල වී ඇත. මෙම තොරතුරු සඳහා කරුණු දෙකක් පදනම්ව ඇති බව සඳහන් කරමි.<br><br>මේ අනුව අතපසු වීමකින් වාර්ෂික පුහුණු බලපත්‍ර අත්හිටුවා ඇති මිනින්දෝරුවරුන්ගේ නාම ලේඛණය සම්බන්ධව අනුමැතිය ලද රැස්වීම් වාර්ථාවක් ඉදිරිපත් වී නොමැත. ඉදිරියේ දී එවැනි දෝෂ ඇති නොවීමට උපදෙස් ලබා දෙන ලදි. | වාර්ෂික මැනුම් බලපත්‍රය අත්හිටවූ මිනින්දෝරුවරුන්ගේ නම් වාර්ෂික වාර්තාවේ ඇතුළත් කළ යුතුය. |
| (v) | 47(3) වගන්තිය | මිනින්දෝරුවරයකු වෘත්තීය විෂමාචාරයට වරදකරු වී ඇතිවිට, ගෙවියයුතු සියලු ගාස්තු හා වියදම් සභාවට අයවියයුතු ණයක් වශයෙන් සභාව විසින් අයකරනු ලැබියයුතු වුවද, වාර්ෂික බලපත්‍ර අත්හිටුවා ඇති මිනින්දෝරුවරුන්ගේ නම ගැසට්පත්‍රයේ පළකිරීම වෙනුවෙන් සභාව විසින් වියදම් කරන ලද මුදල අදාළ | මිනින්දෝරුවරුන් දෙදෙනෙකු විසින් සිදුකරන ලද වෘත්තීය විෂමාචාර වෙනුවෙන් විධිමත් පරීක්ෂණය අනුව 2023 මාර්තු 16 සිට 2026 මාර්තු 15 දක්වා ඔවුන්ගේ ලියාපදිංචිය අවලංගු කර ඇත. (වාර්ෂික බලපත්‍රයද අවලංගු වේ.) ලියාපදිංචිය අවලංගු කිරීමට අදාළව ඔහුගේ නම ගැසට් පත්‍රයේ පලකිරීම වෙනුවෙන් සභාව විසින් දරන ලද වියදම් ද ඔහුගෙන් අය කර ගැනීම, ඔහුට ලබා දෙන දඬුවම් | බලපත්‍ර අත්හිටුවා ඇති මිනින්දෝරුවරුන්ගේ නම ගැසට්පත්‍රයේ පළකිරීම වෙනුවෙන් සභාව විසින් වියදම් කළ මුදල අයකර ගත යුතුය. |

| | |
|---|---|
| මිනින්දෝරුවරුන්ගෙන් අයකර ගැනීම කර නොතිබුණි. | දෙකක් වන බැවින් එය අය කර නොගැනීමට කටයුතු කර ඇත. විගණනයේ පෙන්වා දී ඇති පරිදි කටයුතු කිරීම සඳහා සංශෝධනයක් සිදු කල යුතුව ඇත. (දඩය+ගැසට් ගාස්තු) වරහන් තුළ දක්වා ඇති පරිදි කටයුතු කිරීම සඳහා අදාළ සංශෝධනයන් සිදු කිරීමට සභාව වෙත ඉදිරිපත් කර අදාළ සංශෝධන පිළිබඳව මතය විමසීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,130,667 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 367,510 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,763,157 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මිනින්දෝරුවරුන්ගෙන් අය කරන බලපත්‍ර හා ලියාපදිංචි ගාස්තු වැඩිකිරීම නිසා එම ආදායම රු. 1,834,600 කින් ඉහල යාමත්, ස්ථාවර තැන්පතු බොහෝමයක් කල් පිරීම මත ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 1,796,262 කින් ඉහළ යාමත්, හා 2023 වර්ෂයේ වැඩමුළු පැවැත්වීම හේතුවෙන් වැඩමුළු ශුද්ධ ආදායම ද රු. 528,200 කින් ඉහළ යාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 අනුපාත විශ්ලේෂණය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම වත්කම් අනුපාතය 2022 සහ 2023 වර්ෂවලදී පිළිවෙලින් 2.19 : 1 ක් සහ 2.66 : 1ක් ද ක්ෂණික වත්කම් අනුපාතය 2022 සහ 2023 වර්ෂවලදී පිළිවෙලින් විය 2.15 : 1 ක් සහ 2.62 : 1 ක් ද විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලියාපදිංචි අංක - 19780876 දරන මිනින්දෝරුවරයා වෘත්තිය විෂමාචාරයක් මත 2021 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වාර්ෂික බලපත්‍රය තාවකාලිකව අත්හිටුවා තිබුණද, සියලුම ඉඩම් මැනුම් සම්බන්ධ කාර්යාල දැනුවත් නොකිරීම හේතුවෙන් බලපත්‍රය අත්හිටුවා ඇති කාලය තුළ ඉඩම් මැන පිඹුරුපත් 31 ක් නිකුත් කොට තිබුණි. මේ සඳහා වෙනත් කිසිම නීතිමය ක්‍රියාමාර්ගයක් නොගෙන නැවත වරක් 2023 වර්ෂය සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත්කර තිබුණි. | 2022 වසර සඳහා බලපත්‍ර නිකුත් කර නොමැති අතර 2023 වසරේ බලපත්‍ර ලබා ගැනීමට 2021 වසරේ පිඹුරු නිකුත් කිරීමේ ලේඛණ පරික්ෂා කොට බලා 2023 වසර සඳහා බලපත්‍රය ලබා දීමට කටයුතු කර ඇත. ඉදිරියේදී මෙවැනි දෝෂ ඇති නොවීමට උපදෙස් ලබා දී ඇත. | වාර්ෂික බලපත්‍රය අත්හිටුවූ මිනින්දෝරුවරුන් පිළිබඳ සියලුම ඉඩම් මැනුම් සම්බන්ධ කාර්යාල දැනුවත් කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා නිකුත්කරන ලද අත්පොතේ 6.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් තුළදී කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපතිට ද පිටපත්, සහිතව රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් සභාව 2023 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ ගිණුම් විගණකාධිපතිට ඉදිරිපත් කරන ලද්දේ 2024 ජුනි 03 දිනදීය. | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් 2024 පෙබරවාරි 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදි. නමුත් විගණකාධිපති විසින් අනාවරණය කරන ලද අඩුපාඩු සකස් කර 2024 ජුනි 03 වන දින නැවත එම ගිණුම් ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී එවැනි අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |